දුරකථන (පොදු) / தொலைபேசி (பொது) / Telephone (Common): 0112 696 677, 0112 681 309
දුරකථන (අධ්‍යක්ෂ) / தொலைபேசி (பணிப்பாளர்) / Telephone (Director): 0112 696 508
ෆැක්ස් / பெக்ஸ் / Fax: 0112 690 790
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / Email: director@fhb.health.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: fhb.health.gov.lk

**පවුල් සෞඛ්‍ය කාර්යාංශය**
සෞඛ්‍ය අමාත්‍යාංශය
**குடும்ப சுகாதார பணியகம்**
சுகாதார அமைச்சு
Family Health Bureau
Ministry of Health

මගේ අංකය / எனது இல / Our Ref. No.: FHB MCU/COVID 19 2020
ඔබේ අංකය / உமது இல / Your Ref. No.:
ලිපිනය / முகவரி / Address: 231, ද සේරම් පෙදෙස, කොළඹ 10. / 231, டி சேரம் பிளேஸ், கொழும்பு 10. / 231, De Seram Place, Colombo 10.
දිනය / திகதி / Date: 31/10/2020

## මාධ්‍ය නිවේදනය

ගර්භණී සහ පසු ප්‍රසව මව්වරුන් රෝගී තත්ත්වයන් පවතිද්දී වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොපැමිණීම නිසා අවාසනාවන්ත සිදුවීම් කීපයක් වාර්තා වී තිබේ.

එම මව්වරුන්ට උණ, කැස්ස, හුස්ම ගැනීමේ අපහසුව, යෝනි මාර්ගයෙන් අධික රුධිරය හෝ ශ්‍රාවයන් වහනය වීම, බබා දැහලීම අඩුවීම, ක්ලාන්තය හෝ සිහිසුන් වීම, වලිප්පුව, අධික උදර වේදනාව, සිරුර ඉදිමීම, අධික හිසරදය හෝ අනෙකුත් ඕනෑම අවදානම් ලක්ෂණයක් පවතී නම්, වහාම ළඟම ඇති රජයේ රෝහල වෙත පැමිණෙන ලෙස උපදෙස් දෙනු ලැබේ.

එවැනි අවස්ථාවක ප්‍රතිකාර ගැනීම වහාම සිදුවිය යුතු අතර කිසිදු කරුණක් නිසා ප්‍රමාද නොකළ යුතුය.

රෝගී මව්වරුන්ට අවශ්‍ය ප්‍රතිකාර පැය 24 පුරා ලබාදීමට සියලුම රජයේ රෝහල්වලට උපදෙස් ලබා දී ඇත.

ගර්භණී සටහන්පත ඇඳිරි නීති බලපත්‍රයක් ලෙස සලකනු ලැබේ.

සෑම අවස්ථාවක දීම හෝ ගැටලුවකදී, ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ 1999 හදිසි දුරකථන අංකය ඇමතිය හැකිය.

ඕනෑම රෝගී අවස්ථාවකදී 1990 සුව සැරිය ගිලන් රථ සේවාව ලබාගත හැකිය.

**අධ්‍යක්ෂිකා - මාතෘ හා ළමා**
පවුල් සෞඛ්‍ය කාර්යාංශය
සෞඛ්‍ය අමාත්‍යාංශය